www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාව : යාපනයේ සුනාමියෙන් දිවි ගලවාගත්තෝ ආන්ඩුව විවේචනය කරති

## Sri Lanka : tsunami survivors in Jaffna criticise government

**තිරුඥාන සම්බන්දන් විසිනි**
**2005 පෙබරවාරි 21**

දෙසැම්බර් 26 වෙනි දින සුනාමියෙන් දෙමසකට ලඟාවෙත් ම එහි බලපෑමට හසු වූ ශ්‍රී ලංකාවේ උතුරේ යාපනය අර්ධද්වීපයේ වෙරල බඩ ප්‍රදේශවල ජනයා, රජයෙන් හෝ සෙසු සංවිධානවලින් සහන හිඟ වීම පිලිබඳව කෝපව සිටිති.

ජනාධිපති චන්ද්‍රිකා කුමාරතුංගගේ ආන්ඩුව හා දෙමල ඊලම් විමුක්ති කොටි සංවිධානය (එල්ටීටීඊ) ආධාර දෙන රටවලින් සහ ජාත්‍යන්තර සංවිධාන මගින් ප්‍රදානය කල සීමිත ආධාර පාලනය කිරීමේ ගැටුමක හිර වී සිටින අතර දිවි ගලවාගත්තවුන් කුසගින්න සමග පොර බදමින් සිටි.

*ලෝක සමාජවාදී වෙබ් අඩවියේ* වාර්තාකරුවන් සුනාමි ප්‍රහාරයට ගොදුරු වූ යාපනය අර්ධද්වීපයේ වඩමරච්චි ප්‍රදේශයේ පසුගිය ජනවාරියේ හා පෙබරවාරි මැද දී ද නැවත සංචාරය කලහ. විපතට පත්වූවන්ගේ තත්වය දෙසැම්බර් 26ට පසුව යහපත් අතට හැරුනියි යමෙකු සිතා සිටියේ නම් ඔවුන් කම්පනයට පත්වනු ඇත. උතුරු නැගෙනහිර දෙමල ජනතාවට එරෙහිව ශ්‍රී ලංකාවේ බලධාරින් විසින් ගෙන යනු ලැබූ 20 අවුරුදු කුරිරු සිවිල් යුද්ධයෙන් පසුව, සුනාමි ව්‍යසනයේ මුලු බර ජනතාව මත පටවා තිබේ.

පුලෝලි දෙමල මෙතෝදිස්ත මිශ්‍ර පාසල, උතුරේ හින්දු කාන්තා විද්‍යාලය හා තම්බසිටි ද්‍රවිඩ මෙතෝදිස්ත මිශ්‍ර පාසල පිලිවෙලින්, පවුල් 104 කට අයත් 520, පවුල් 29 කට අයත් 145 හා පවුල් 70කට අයත් 257 ජනයාගේ සරනගත කඳවුරු බවට පත් වී තිබේ. එල්ටීටීඊ හි පිටුබලය ලබන දෙමල පුනරුත්ථාපන සංවිධානය (ටීආර්ඕ) මගින් මෙම කඳවුරු පාලනය කරනු ලබයි. රජයේ නියෝජිතයන් හෝ නිලධාරීන් ද එහි පෙනෙන්නට නැත.

නිසි ජලාපවාහන පද්ධතියක් නොමැති කඳවුරු දුගඳින් පිරී තිබේ. සැම තැන ගැවසෙන මැස්සන් , නිසැකව ම වසංගත රෝග පිලිබඳ ලඟ එන අනතුරක් පැහැදිලිව ම පෙන්නුම් කරයි. වැසිකිලි පහසුකම් කිසි සේත් ප්‍රමානවත් නො වේ. සිය ගනන් මිනිසුන්ගේ ප්‍රයෝජනයට ඇත්තේ වැසිකිලි තුනක් හෝ හතරක් බැවින් දිගු පෝලිම්වල රැඳී සිටීමට සිදු වේ. ඉඩකඩ මඳ බැවින් පවුල් කීප සීයකට ම එක පංති කාමරයක් බෙදා ගැනීමට සිදු වී තිබේ.

බලපෑමට හසු වූ පවුල්වලට නව නිවාස තනා දෙන තුරු තාවකාලික වාසස්ථාන ලෙස කුඩාරම් ලබා දෙන බවට ආන්ඩුව පොරොන්දු විය. එහෙත් මේ දක්වා ඔවුන්ට කුඩාරම් පවා නො ලැබුනු බවට ජනයා පැමිනිලි කරති. ''කුඩාරම් සැපයීමට පවා නොහැකි ආන්ඩුවක් අප අලුත් නිවසක පදිංචි කර අපට රැකියා සපයා දෙන්නේ කෙසේ ද?'' යන්න කඳවුරුවල වෙසෙන බොහෝ දෙනා ප්‍රශ්න කරති.

ඔවුන්ගේ මූලික දෛනික අවශ්‍යතා සඳහා වත් ඔවුන්ට මුදල් නැත. සහනාධාර කූපන් නිකුත් කර ඇත්තේ සති 32කට පමනි. නමුත් එක් පුද්ගලයෙකුට සතියක් සඳහා ලැබෙන්නේ යන්තම් සෑහෙන රුපියල් 375 (ඈ. ඩො. 4) කි. රැවුල නොබෑ මිනිසුන් අපි දුටුවෙමු. සුනාමියේ බලපෑමට ගොදුරු වූ අර්ධද්වීපයේ අනෙක් ප්‍රෙදේශවල සිටින ඔවුන්ගේ ඥාතීන් දැක ගැනීමට හෝ අවමඟුලකට සහභාගි වීමට හෝ හැකියාවක් ඔවුන්ට නොමැත. එක් පුද්ගලයෙකු ප්‍රකාශ කර සිටියේ, ''මට මගේ දරුවන් තිදෙනා අහිමි වුනා. සැතපුම් කීපයක් එහා සිටි මිය ගිය මගේ ඥාතීන් කීප දෙනෙකුගේ මලගමට සම්බන්ධවීමට වත් මට මුදල් තිබුනේ නැහැ. අප මෙහි ජීවත්වන්නේ සිරකරුවන් වගේ.

වැල්වටිතුරයි, වියාපාරමුල්ලයි, ආදිකෝවිලයි, පොලිකන්ඩි, ඉන්පුරුට්ටි, සුපර්මඩම්, කාක්කෙතීවු හා මුනෛ ආදි ධීවර ගම්මානවලින් අවතැන් වූවන් බලධාරින් විසින් දැනටමත් ඔවුන්ගේ හානි වූ නිවාසවලට ආපසු යවා ඇත. එහෙත් වාසයට නුසුදුසු මෙම ප්‍රදේශ තවමත් හානි වූ නිවාස, දැල්, බෝට්ටු ඇතුලු ධීවර ආම්පන්නවල සුන්බුන්වලින් පිරී පවතී.

සුනාමියෙන් සියලු ම ගොඩනැගිලි හානියට පත් මනට්කාඩු ප්‍රදේශයේ නැවත ඉදිකර ඇත්තේ හමුදා කඳවුරු පමනි. කඳවුර නැවත ගොඩනැගීමේ දී හමුදා නිලධාරීන්, හානියට පත් නිවාසවල ද්‍රව්‍ය ප්‍රයෝජනයට ගෙන ඇති බැවින් ප්‍රදේශයේ ජනතාවගේ ප්‍රශ්න තවත් උග්‍ර වී ඇත.

නිවෙස් වෙත තල්ලු කර හරිනු ලැබූ ජනයා සම්පත් නොමැති හෙයින්, පහසුවෙන් බිඳෙන සුලු ද්‍රව්‍ය යොදාගෙන තාවකාලික අලුත්වැඩියා කිරීම් කර ගෙන ඇත. නිවාස අසම්පූර්න ලෙස ආවරනය වන පරිදි බිත්ති වෙනුවට රෙදි යොදාගෙන ඇත. බොහෝ අවස්ථාවල දී පවුල් දෙක තුනකට එක නිවසක් බෙදා ගැනීමට සිදු වී ඇත. සුනාමිය නිසා ප්‍රදේශයේ ලිං මඩවලින් පිරී යෑමේ හේතුවෙන් පානීය ජල හිඟය

බරපතල ප්‍රශ්නයක් බවට පත් වී තිබේ. ජලය සැපයීම සඳහා ඇත්තේ බවුසර් කීපයක් පමනක් බැවින් පිරිසිදු ජලය ලබා ගැනීම සඳහා ජනයාට කිලෝ මීටර් ගනන් දුර පයින් යෑමට බල කෙරී ඇත.

සුනාමිය බොහෝ ජනයාගේ රැකියා හා ජීවනෝපායන් විනාශ කර දැමී ය. කිසියම් ආධාරයක් නොමැතිව දැල්, යන්ත්‍ර බෝට්ටු ඇතුලු ධීවර ආම්පන්න අලුත්වැඩියා කර ගැනීමක් ගැන ඔවුන්ට සිතීමට වත් නොහැකි ය. බෝට්ටු අලුත්වැඩියා කර දෙන බවට බලධාරීන් පොරන්දු වූහ. අන්ඩ දමන ආකාරයෙන් අලුත්වැඩියා කල බෝට්ටු දින කීපයක් වත් පැවතුනේ නැත. ඒවායෙන් මුහුදු යෑම අනතුරුදායක බව ධීවර සමුපකාර සංගමයේ නියෝජිතයෝ ප්‍රකාශ කලහ.

ධීවර බෝට්ටු බැඳ තබන නොගැඹුරු ස්ථාන අහුරා සිටින යෝධ ගල් ඉවත් කිරීම සඳහා බලධාරීන් බැර යන්ත්‍ර හෝ වෙනත් ආධාරයක් සැපයීම හෝ ප්‍රතික්ෂේප කරයි. ප්‍රදේශය පිරිසිදු කර ගැනීමේ කාර්යයන් තමත් විසින් ඉටු කර ගත යුතු බව ආන්ඩුවේ නිලධාරින් කියති. උදාහරනයක් ලෙස ගත හොත් වැල්වටිතුරයි සිට මුනෙ දක්වා දිවෙන කිලෝ මීටර් 10, එකක් කි. ග්‍රෑ. 75-100 දක්වා බරැති ගල්වලින් ඇහිරී පවතී. බුල්ඩෝසර් වැනි බර වාහන අවශ්‍යව තිබිය දී මිනිසුන්ට මෙම ගල් ඉවත් කල හැකි දැයි? ජනයා කෝපයෙන් යුතුව ප්‍රශ්න කරති.

මනට්කාඩු සමුපකාර සමිතියේ ධීවරයෙකු වූ රාජන් ප්‍රකාශ කලේ, අපට  අවශ්‍ය වන්නේ නිවාස සහ ධීවර රැකියා සඳහා පහසුකම්. අප වෙනත් රැකියාවක් දන්නේ නැහැ. මුහුදු බඩ ප්‍රදේශය දිගටම හමුදාව විසින් දැමූ කටුකම්බි වැටවල් නිසා අපේ ප්‍රදේශයේ මිනිසුන් 75 මිය ගියා. රලට ගසාගෙන ආව කැඩුනු කටු කම්බිවල මිනිසුන් ඇමිනීම නිසා ඔවුන්ට හෙල්ලෙන්න වත් බැරි වුනා. නමුත් උතුරු හා නැගෙනහිර සියලු ම කඳවුරු මේ වන විට නැවත ගොඩනගා හමාරයි.

මනට්කාඩුවෙන් පැමිනි 47 වියැති වික්ටෝරියා ආන්ඩුව හා එල්ටීටීඊය පිලිබඳව අවිශ්වාසය පල කලා ය. ''අප සියදිවි නසා ගැනීමට තැත් කල හොත් ආන්ඩුවේ අධිකාරින් අපව සිර කර විභාගයක් පවත්වයි. අපි දැන් හාමතේ මැරෙන්න වැටිලා ඉන්දැද්දි ආන්ඩුව කරන්න යන්නේ කුමක් ද? අපට උදව්කරන්න එන්නේ කවු ද? රජය ද? අනෙක් සංවිධාන ද? (එල්ටීටීඊය අදහස් කෙරේ) එසේ නැති නම් ශිෂ්‍යයින් ද? (එල්ටීටීඊයට සහය දෙන)''

පවුල් 16 ක් එක් පංති කාමරයක ජීවත්වීමේ දී බෝවන රෝග ඇතිවීමේ යථා තර්ජනයක් පවතින බව කූඩත්තනායි රජයේ දෙමල මිශ්‍ර පාසල් කඳවුරේ නතරව සිටින දර්ශනි ප්‍රකාශ කලා ය. සැවොම රජයට දොස් පවරති.

59 වියැති මහ ලක්ෂ්මී, එදින ඔවුන්ට මිරිස් හා සුදුලූනු කැඳ ලැබුනු බව පැවසීය. ''අප සැවොම කනස්සල්ලට පත්ව සිටින්නේ අපේ දරුවන් ගැනයි. සමහර පාසල් නැවත විවෘත කර ඇති නමුත් නිරාහාර දරුවන් පාසල් යවන්නේ කොහොම ද? හරියට කෑමක් නැතුව පාසල් ගිය සමහර දරුවන් ක්ලාන්ත වුනා. මගේ දරුවන්ට කිරිපිටි මිල දී ගැනීමට මට රුපියල් 150ක් අවශ්‍යයි. දරුවන් 100ක් පමන මෙම ගමේ සිටිනවාඃ අප බලධාරින් වෙත ගොස් කිරි ඉල්ලූ විට ඔවුන් ගනන් නොගෙන ඔහේ ඉන්නවා''.

පුලෝලි මෙතෝදිස්ත මිශ්‍ර පාසල් කඳවුරෙහි සිටින 44 වියැති පනීර් සෙල්වම්ට ඔහුගේ බිරිඳ හා දරුවන් තිදෙනා අහිමි විය. මනට්කාඩුවෙන් පැමිනි 34 වියැති එඩ්මන් රාජාට ඔහුගේ දරුවන් සිව් දෙනාගෙන් තිදෙනෙක් අහිමි විය. වන්දි ලබා ගැනීම සඳහා ඔවුන් නිල ලේඛනවලට ඇතුලත් නො කිරීම ගැන ඔවුහු පොලිසියට චෝදනා කලහ. පැමිනිලි කිරීම සඳහා රාජා දින 15ක් පොලිසියට ගොස් තිබේ. මනට්කාඩුවෙන් පැමිනි සමහර ජනයා කූඩත්තනායි හි තහඩු සෙවිලි කල පැල්පත්වලට මාරු වූහ. එහෙත් උනුසුම නිසා එම නිවාසවල ජීවත්වීම දුෂ්කර බව ඔවුහු කීහ.

වාහන ගමනාගමනය සඳහා මංමාවත් එලිපෙහෙලි කල ද අනෙක් සුන්බුන් ඉවත් කිරීම සඳහා ක්‍රියාත්මක වී නොමැත මුනෙ හා සුපර්මඩම් වැනි සමහර ප්‍රදේශවල පදිංචිකරුවන් සුන්බුන් ඉවත් කිරීමේ ප්‍රයත්නයක නිරතව සිටිති.

1990 කන්කසන්තුරේ සිට පැමිනි පවුල් 300 අයත් යුධ අනාථයෝ සුපර්මඩම් ප්‍රදේශයේ සිටිති. පාසල නැවත විවෘත කිරීම සඳහා පහසුකම් සැලසීමට එයින් ඉවත් වන ලෙස එල්ටීටීඊ දේශපාලන අංශ සාමාජිකයෝ පැමින ඔවුන්ට කීහ. පවුල් විසින් ඔවුන්ගේ අන පිලිපැදි නමුත් ඔවුන්ගේ නිවාස නැවත ඉදිකර ගැනීම සඳහා කිසිදු සහනයක් නොලැබුනි. 49 වියැති ජේසුතාසන් ඔහුගේ නිවස අලුත්වැඩියා කර ගැනීමට උත්සාහ ගත්තේ බිත්ති වෙනුවට සාරි උපයෝගි කර ගනිමිනි.

සුනාමියට ගොදුරුවුවෝ එල්ටීටීඊය යටතේ පෙල ගැසී සිටින දෙමල ජාතික සංධානයේ දේශපාලඥයින් ද විවේචනය කලහ. ''මැතිවරන සමයේ ඔවුන් අපේ ඡන්ද ඉල්ලන්න එනවා. දැන් ඔවුන් අපව බලන්න වත් එන්නේ නැහැ. අපේ ඡන්ද ඉල්ලන්න ඔවුන් නැවත ආවොත් අපට සිදුවනු ඇත්තේ ඔවුන් එලවා දැමීමට'' යි. ජනයා ප්‍රකාශ කලහ.

ඉඩම්වල මිල ගනන් ඉහල බැවින් ආන්ඩුව බලකර සිටින, මුහුදේ සිට මීටර් 300ක් අතරතුර නිවාස තැනීමේ තහනම් නීතිය අනුව  නිවසක් තනා ගැනීම විශ්වාස කල නොහැකි සිහිනයක් බවට පත්වී ඇතැයි සුපර්මඩම් සමුපකාර ලේකම් කමලනාදන් පැවසී ය . ''අපට කෑම හෝ ජලය වැනි සුලු දෙයක් වත් සැපයීම නොතකා සිටින ආන්ඩුවක් සුදුසු තැනක හොඳ නිවසක් ලබා දේවි ය යි බලාපොරොත්තු තැබිය හැකි දැයි'' ඔහු ප්‍රශ්න කලේ ය.

© www.wsws.org